නව සම සමාජ පක්ෂය
நவ சம சமாஜ கட்சி
NAVA SAMA SAMAJA PARTY
4 වන ජාත්‍යන්තරයේ ශාඛාව
4 வது அகிலத்தின் கிளை
Section of the 4th international
17, බැරැක්ක පටුමග, කොළඹ 02. இல.17, பெரக் ஒழுங்கை, கொழும்பு 02. 17, Barrack Lane, Colombo 02.
Tel:. 011 2430621 Fax:011 2305963 email - nssp.lk@gmail.com Web:www.haraya.today

**ලාංකීය දෙමළ විමුක්ති අරගළයේ එක් යුගයක නිමාව -**
**2009 මුල්ලිවයික්කාල් වර්ග සංහාරය**

යුගයක් නිමා වන්නේ නව යුගයක ඇරඹුමකට විවර කරමිණි. අද, මැයි 18 වැනි දා; ලාංකීය දෙමළ විමුක්ති අරගලයේ යුගයක නිමාව දුටු; 2009 මැයි 18 වැනිදා සිට ගත් කල 17 වන අනුස්මරණ දිනය එළඹී තිබේ. එය අන් කිසිවක් නොවේ. එදා මෙදා තුර දශක ගණනාවක් පුරා දෙමළ ජනතාව මේ භූමියේ තමන් එක සමාන ජාතික අනන්‍යතාවයක්, උරුමයක්, හා ගෞරවයක් ඇති ජාතියක් බවත්; ඒ කිසිවකින් සිංහල බෞද්ධ ‘බහුතරයට’ දෙවැනි වන්නේ නැති බවත්, ලෝ වාසී ශීලාචාර මිනිස් වර්ගයාට ඒත්තු ගැන්වීම සඳහා ගෙන ගිය; කිසිම මිනුමකින් මිනිය නොහැකි පරිත්‍යාගශීලි නිදහසේ අරගලය සංකේතවත් කරන දිනයයි.

නව සම සමාජ පක්ෂයේ අපි මේ දිනය සංකේතවත් කරන්නේ දෙමළ විමුක්ති අරගලයේ යුගයක නිමාවක් යයි කියමු. කියන්නේ එකම එක අර්ථයකිනි. ඒ දෙමළ විමුක්ති අරගලයේ ඊළඟ යුගය ආරම්භ වූ දිනයද එයයි යන අර්ථයෙනි. 2009 මැයි මාසයේදී මුල්ලිවයික්කාල්හිදී ඝාතනය කරන ලද අය පමණක් නොව, දශක ගණනාවක් තිස්සේ දෙමළ ජනතාව මුහුණ දුන් වෙනස් කොට සැළකීම්, වර්ග සංහාර, හමුදා ආධිපත්‍යය හා ප්‍රචණ්ඩත්වය, සිවිල් අයිතිවාසිකම් සුනුවිසුණු කිරීමේ දිගු ඉතිහාසය ද අපි සිහිපත් කරමු.

සිංහල-බෞද්ධ බහුතරවාදයේ පීඩනයටත් බවටත්, මනුෂ්‍යත්වයට කරන අපරාධයන්ටත් එරෙහිව නව සම සමාජ පක්ෂය නොසැලී පෙනී සිටී. ඒ ඇය ගේ පාරම්පරික උරුමයයි. එක් ජාතියක් තවත් ජාතියක් මත ආධිපත්‍යය දරණ තාක් දුරට ලංකාවේ පමණක් නොව ලොව කිසිම දේශයක මනුෂ්‍යත්වයේ පරමාදර්ශය වන සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී ජීවනය පැවතිය නොහැකි බව ඇය අදහන දහමයි. බහුතරයේ බලහත්කාරයෙන් සහ බහුතරයින්ගේ රාජ්‍යයේ මර්දනයෙන් තොරව දෙමළ ජනතාව සතු මනුෂ්‍යත්වයේ උරුමය වන ස්වපාලන සඳහා වන අරගලයේ නව යුගය අපි මේ මුල්ලිවෙක්කාල් සැමරුමේ සටන් පාඨය බවට ප්‍රකාශ කර සිටිමු. අපි බලා සිටින්නේ එය ඔබ සැමගේ හඬින් රැවු පිලිරැව් දෙන මොහොතට සහභාගී වීමටයි. ඒ හඬ දෙමළ - සිංහල - මුස්ලිම් ජනතාවගේ; විශේෂයෙන් දකුණු-උතුරු-නැගෙනහිර නිර්ධන පංතියේ මුවින් නැගෙන කාහල නාදය බවට පත්වන දිනය නුදුරුය. ඔව් අපි එය, ස්ථිරවම එසේ කියමු.

- දෙමළ ජනතාවගේ ස්වයංතීරණ අයිතිය තහවුරු කරනු.
- උතුරු හා නැගෙනහිර හමුදාකරණයට තිත තබනු.
- අතුරුදහන් වූවන්ට සත්‍ය, යුක්තිය සහ යුද අපරාධ සඳහා වගවීම තහවුරු කරනු.
- හදිසි නීති රෙගුලාසි, ඒ ආශ්‍රිත PTA හා PSTA අහෝසි කරනු. සියළුම දේශපාලන සිරකරුවන් නිදහස් කරනු.
- පලාත් සභා ක්‍රමය ස්වපාලන අධිකාරයන් ලෙස වැඩි දියුණු කරනු.

මුල්ලිවයික්කාල් අපට නැවත නැවතත් සිහිගන්වන්නේ, පීඩනයට ගොදුරු වූ සියලු දෙනාගේ මතකය, සමානාත්මතාවය, ප්‍රජාතන්ත්‍රවාදය සහ ජනතාවගේ නිදහස් සංගමය තහවුරු වන ස්වපාලයෙන් දීප්තිමත් වූ මනුෂ්‍යත්වයෙන් පිරිපුන් නිදහස් ලංකාවක් සඳහා වන සටන ශක්තිමත් කළ යුතු බවයි. ඒ සටනේ නියත ජයග්‍රහණයෙන් පෘථිවිය සිසාරා පැතිර යන දීප්තිය, ලොව පුරා මිනිස් වර්ගයා තමන්ගේ නිදහසේ අරගලය අරඹන මොහොත වනු ඇත්තේ ය.

මෙම 17 වන දෙමළ ජනතාවගේ නිදහසේ අරගලයේ මුල් යුගය නිමා කළ දින අනුස්මරණය කරමින් අපි ප්‍රාර්ථනා කරනුයේ, එළඹෙන නව අරගල යුගයේදී ලෝ වාසී සැමගේ මනුෂ්‍යත්වයේ ජයග්‍රහණය වන ස්වපාලනය සාක්ෂාත් කර ගැනීමට ලැබෙනු නියත වේවා කියායි.

රණ්ජිත් කුමාරසිංහ
ප්‍රධාන ලේකම් - නව සමසමාජ පක්ෂය
2026 මැයි 18